Australian Government
Department of Home Affairs

# මාගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී ඇත

## කෝවිඩ්-19 පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර

ඔබට වීසා බලපත්‍රයක් නැති වුවද, නැතිනම් ඔබගේ වීසා බලපත්‍ර තත්වය සම්බන්ධයෙන් පැහැදිලි නැතිනම්, ඔබ විසින් මහජන සෞඛ්‍ය විධාන අනුගමනය කල යුතුය. ඔබට අසනීප නම්, වෛද්‍ය උපදෙස් ලබා කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කර ගන්න.

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදු කෙරේ.

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි
- නිව් සවුත් වේල්ස්
- නොදර්න් ටෙරිටරි
- ක්වීන්ස්ලන්ඩ්
- සවුත් ඕස්ට්‍රේලියා
- තස්මේනියා
- වික්ටෝරියා
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා

## මාගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී ඇත

### දින 28 ක් ඇතුලත කාලය ඉකුත්වී ඇත

ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී ඇතිනම්, නීත්‍යානුකූලවීම සඳහා හැකි විගස Bridging visa E (BVE) වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය. BVE වීසා බලපත්‍රයක් යනු, ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත්වීම සඳහා කටයුතු කරන අතර ඔබට නීත්‍යානුකූලව සිටීම සඳහාවූ කෙටි කාලීන වීසා බලපත්‍රයකි.

ඔබට ඔස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව සිටීමට අවශ්‍ය නම්, අළුත් වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය. ඔබගේ අවස්ථානුගත කරුණු අනුව ඔබට ඇති වීසා බලපත්‍ර විකල්ප සහ නීත්‍යානුකූලව සිටීමට කලයුතු දේ නිර්ණය වනු ඇත. ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වූයේ කොපමණ කාලයකට පෙරද යන්න මත, ඔබ ඕස්ට්‍රේලියාවේ සිටින අතරතුර ඔබට අයදුම්කල හැකි වෙනත් වීසා බලපත්‍ර සම්බන්ධ සීමා තිබිය හැකිය.

අයදුම්පත්‍ර ක්‍රියාවලිය සම්බන්ධ සමහර සේවා කෝවිඩ්-19 හේතුවෙන් බලපෑමකට ලක්වී තිබිය හැකි අතර අපට අවශ්‍ය සේවා බොහෝමයක් (වෛද්‍ය පරීක්ෂණ සහ ජීවමිතික දත්ත රැස් කිරීම ආදී) ලබාගත නොහැක. පරීක්ෂණ සම්පූර්ණ කර ගැනීමට සහ ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීම සඳහා අයදුම්කරුවන් හට අමතර කාලය ලබාදෙනු ඇත.

### දින 28 කට කලින් කල් ඉකුත්වී තිබීම

ඔබගේ වීසා බලපත්‍රයේ කාලය දින 28 කට කලින් ඉකුත්වුණි නම්, ඔබගේ සංක්‍රමණ තත්වය විසඳ ගැනීම සඳහා කරුණාකර Status Resolution Service (SRS) සමඟ සම්බන්ධ වන්න.